**මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය-2 - 2014**

-------------------------------------------------------------------

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 2 හි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන සංවර්ධන බැංකු සහයෝගීතාවය අතර 2011 මාර්තු 31 දින එළඹි අංක 4500062212011110472 දරන ණය පහසුකම් ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා කාලය

-------------------------------------------------------------------

ණය පහසුකම් ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තු යටතේ අරමුණුගත ප්‍රමුඛතා මාර්ග කිලෝමීටර 591.48 ක් වැඩිදියුණුව හා පුනරුත්ථාපනය ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 61,438 කට සමාන එ.ජ.ඩො. මිලියන 556 ක් වූ අතර එයින් රු. මිලියන 55,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 500 ක් චීන සංවර්ධන බැංකුව විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 ජූනි 28 දින ආරම්භ කළ අතර 2014 ජූනි 28 දින අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය

පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම රු. මිලියන 69,881 ක කෙරීගෙන යන වැඩ සහ වටිනාකම රු. මිලියන 11,458 ක කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂ වැරදි ගිණුම් ගත කිරීම් හේතුවෙන් රු. මිලියන 245.29 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| චීන සංවර්ධන බැංකුව | 500 | 55,250 | 19,368.6 | 147.00 | 19,267.7 | 375.94 | 49,328 |
| ශ්‍රී.ලං.ර | 56 | 6,188 | 1,819.3 | 13.88 | 1,819.3 | 46.87 | 6,150 |
| | **556** | **61,438** | **21,187.9** | **160.88** | **21,087.0** | **422.81** | **55,478** |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදිත එ.ජ.ඩො. මිලියන 500 ක ණය මුදලින් ලද එ.ජ.ඩො. මිලියන 375.94 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කර තිබුණි. ණය යටතේ ප්‍රතිපාදනයෙන් සියයට 75 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට උපයෝජනය කර තිබුණු බව මෙමඟින් පිළිබිඹු විය.

### 3.2 භෞතික ප්‍රගතිය

ජාතික මාර්ග කොටස් 18 ක කිලෝමීටර 476.48 ක්, නුවරඑළිය හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල පළාත් මාර්ග කිලෝමීටර 115 ක් ප්‍රතිසංස්කරණය කිරීම, ගුවන් පාලම් 02 ක් ඉදිකිරීම හා පාලම් 18 ක් යළි ඉදිකිරීම ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට ඇතුළත් වී තිබුණි. ඉදිරිපත් කළ තොරතුරු අනුව, බදුල්ල, කළුතර හා මහ නුවර දිස්ත්‍රික්ක වල ජාතික මාර්ග කොටස් 3 ක් හැර හා නුවරඑළි දිස්ත්‍රික්කයේ පළාත් මාර්ගවල සියළුම මාර්ග වැඩ, ගුවන් පාලම් ඉදිකිරීම් හා පාලම් යළි ඉදිකිරීම් ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. ජාතික මාර්ගවල කොටස් 3 ක් හා පළාත් මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ 2014 ජූනි 30 දින වනවිට සැලකිය යුතු ලෙස සම්පූර්ණ කර තිබුණු බව ව්‍යාපෘති අධ්‍යක්ෂක දන්වා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හොරවල-පැලවත්ත-පිටිගල මාර්ගයේ ස්ථාන 06 ක ගල්කුඩු මාර්ග තලය වෙනුවට කොන්ක්‍රීට් මාර්ග තලය ලෙස විෂය පථය වෙනස් කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය එවැනි වෙනස්වීම් වලට හේතු පැහැදිලි කර නොතිබුණි. තවද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා වන විචලතා නියෝග අනුමත කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. කොන්ක්‍රීට් තරලයේ දුර්වලතා හේතුවෙන් මාර්ගයේ

යාන්ත්‍රණ තත්ත්වය සැලකිය යුතු පරිදි නොතිබුණු බව විගණකයින් සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂණ වලදී අනාවරණය විය. තවද, මාර්ගයේ කිලෝමීටර 0+155 දී ඉරිතැලීම් හා මාර්ගයේ කිලෝමීටර 4+235 සිට 4+ 240 දක්වා සිදුරු පැවතුණි. ඊට අමතරව කොන්ත්‍රාත් ගිවිසුමේ තාක්ෂණික පිරිවිතර අංක 506.5 (ජේ) අනුව තලන ලද මතුපිට තලයේ සියළු සාම්පල වල තිබිය යුතු ඝනකමෙන් සියයට 98 ට වඩා අඩු නොවිය යුතු වුවත් ස්ථාන 18 ක ගල්කුඩු කොන්ක්‍රීට් තැලීම ඉහත සීමා වලට ලඟා වී නොතිබුණි.

(ආ) තිරුවානකැටිය - අගලවත්ත මාර්ගයේ ප්‍රතිසංස්කරණය සඳහා වූ කොන්ත්‍රාත්තුව 2013 දෙසැම්බර් 11 දිනට පෙර සම්පූර්ණ කිරීමට නියමිත වූ අතර 2015 ජූලි 15 දක්වා දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි වල 8.3 වගන්තිය අනුව, ප්‍රමාදයන් ආවරණය කිරීමට හා නියමිත දිනට වැඩ නිම කිරීමට සංශෝධිත වැඩසටහනක් කොන්ත්‍රාත්කරු ලබා දිය යුතුය. කෙසේ වෙතත් එවැනි සංශෝධිත වැඩසටහනක් කොන්ත්‍රාත්කරු ලබා දී නොතිබුණි. අවට ඉඩම් හිමියන්ට හා මාර්ග භාවිතාකරන්නන්ට සිදුවන අපහසුතා අවම කිරීමට පාරිසරික ආරක්ෂණ සැලැස්ම සමඟ කොන්ත්‍රාත්කරු අනුකූල වී නොතිබුණු බවත් කොන්ත්‍රාත්කරුට විරුද්ධව විවිධ චෝදනා ඇති බවත් මේ සම්බන්ධයෙන් කළ ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අනාවරණය වී තිබුණි.

(ඇ) මෙම මාර්ග එකම ප්‍රදේශයේ පිහිටා ඇතත් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කළ හොරවල-පැලවත්ත-පිටිගල මාර්ගයේ ප්‍රමාණ පත්‍රය සඳහා යොදා ගත් රේට ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති 1 යටතේ ප්‍රතිසංස්කරණය කළ තීනියාවල-කන්කොටියාවත්ත-මොරවක මාර්ගයේ ප්‍රමාණ පත්‍රය සඳහා යොදා ගත් රේට සමඟ සැසඳීමේදී සැලකිය යුතු පරිදි වෙනස් බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, එම මාර්ග වල ප්‍රතිසංස්කරණය සඳහා කිලෝමීටරයක පිරිවැය පිළිවෙලින් රු. මිලියන 102 ක් හා රු. මිලියන 73.5 ක්ව පැවතුණි. වෙනස් රේට යොදාගැනීම සඳහා හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

2007 අප්‍රේල් 5 දිනැති කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 33 හි ප්‍රතිපාදනයන්ට පටහැනිව උපදේශකවරු 04 ක් බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙත එකතුව රු. මිලියන 2.82 ක පාරිශ්‍රමික හා ප්‍රවාහන දීමනා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය වෙත ඔවුන්ගේ දායකත්වය තක්සේරු කිරීමට හැකිවන ලෙස කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.